මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක **09/2024** **2024.07.02**

**නිදහස් හා සාධාරණ අයුරින් ඡන්ද විමසීමක් පැවැත්වීම.**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම කල්තබා ඇති හෙයින් සහ මේ දක්වා එම ඡන්ද විමසීම පවත්වා අවසන් නොමැති බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඒ වගන්තිය ප්‍රකාරව මැතිවරණ නීතිය තවමත් බලාත්මකව පවතී. එසේම පළාත් පාලන මැතිවරණ නීතිය බලපවත්වන කාල සීමාව තුළ කිසිඳු දේශපාලන පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයක් නොවන සේ කටයුතු කළ යුතු බවට හා ඒ සඳහා කිසිඳු රාජ්‍ය දේපලක් යොදා නොගත යුතු බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ.(4)(අ) අනුව්‍යවස්ථාව අනුව සියලු රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැනුම්වත් කරමින් 2023.01.04 දිනැති අංක 2313/32 දරන විධාන ගැසට් පත්‍රය හා රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන කාලසීමාව තුළ දී නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම සම්බන්ධයෙන් 2023.01.05 දිනැති අංක 20 දරන චක්‍රලේඛය මඟින් මැතිවරණ කොමිෂන් සභාව නියෝග නිකුත් කර ඇත. මැතිවරණ නීති බලාත්මක බැවින් උක්ත ගැසට් නිවේදන හා චක්‍රලේඛ තව දුරටත් වලංගුව පවතී.

ඒ අනුව මෙම කාල සීමාව තුළ දී දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියට පත්වන අයුරින් ක්‍රියා කිරීම විශේෂයෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට තරග කිරීම සඳහා නාමයෝජනා භාර දී ඇති අපේක්ෂකයන් එවැනි කාර්යයන් සඳහා යොදා ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන, මැතිවරණ පනත් හා චක්‍රලේඛ උල්ලංඝණය වන දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

ඉදිරි ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණ අයුරින් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති විධාන හා චක්‍රලේඛවලට අනුගතව ක්‍රියා කරන මෙන් අදාළ සියලු පාර්ශ්ව වෙතින් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටී.

ආර්.එම්.ඒ.එල් රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)